# අධිකරණ කටයුතු වල ප්‍රමාදයන් අවම කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග



ජනාධිපති මාධ්‍ය කේන්ද්‍රය
ஜனாதிபதி ஊடக மையம்
PRESIDENTIAL MEDIA CENTRE

2022-02-17

President's Media Division
Presidential Secretariat, Colombo 01, Sri Lanka
Tel: 0114 354 354, Fax: 0112 394 919 Email: spokesman@presidentsoffice.lk

# <u>අධිකරණ පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග</u>

වත්මන් රජය බලයට පත්වන විට, ව්‍යාපාර සිදු කිරීමේ පහසුම දර්ශකයේ රටවල් 190ක් අතරින් ශ්‍රී ලංකාව 111 වන ස්ථානයේ පසුවූ අතර, ගිවිසුම් බලාත්මක කිරීමේ දර්ශකයේ රටවල් 190 අතරින් 165 වන ස්ථානයේ පසු විය. මෙලෙස ශ්‍රේණිගත කිරීම් වල පහල ස්ථානයක රැදී සිටීම සඳහා හේතු ලෙස අධිකරණයේ ගොඩගැසී ඇති විශාල නඩු සංඛ්‍යාවත්, නඩුවක් විසඳීමට ගතවන දීර්ඝ කාලයත් බලපා ඇත.

ඒ අනුව දැනට ජනගහනයෙන් මිලියන 1කට 15ක් ලෙස සිටින විනිසුරුවරුන් සංඛ්‍යාව පළමු අදියර ලෙස විනිසුරුවරුන් 30ක් ලෙසත් 2 වන අදියරේදී 50 දක්වාත් වැඩි කිරීම ඉලක්ක කරගෙන රජය වැඩපිළිවලක් ක්‍රියාත්මක කරමින් සිටියි.

ඒ අනුව එම වැඩි කරන විනිශ්චයකාරවරුන් සංඛ්‍යාවට සරිලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට සහ නවීන තාක්ෂණය අධිකරණ පද්ධතිය තුලට හඳුන්වා දීමටත්, යල්පැන ගිය නීති පද්ධතිය යාවත්කාලීන කිරීමටත් රජය කටයුතු කරමින් සිටියි.

එසේම විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය ශක්තිමත් කොට අධිකරණය වෙත පැමිණෙන නඩු සංඛ්‍යාව අඩු කිරීම සඳහාද රජය වැඩපිළිවල රැසක් ක්‍රියාත්මක කර ඇත.

- වත්මන් රජය ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් සංඛ්‍යාව 07 කින් හා අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් සංඛ්‍යාව 08 කින් වැඩි කරන ලදී. මෙම උපරිමාධිකරණවල විනිසුරුවරුන් වැඩි කිරීම වසර 40කට පසුව සිදු කළ සුවිශේෂී අධිකරණ ප්‍රතිසංස්කරණයකි.

- එම විනිසුරුවරුන් සඳහා අවශ්‍ය නිල මැදිරි, අධිකරණ ශාලා මාස 02ක් තුළ නිමකොට 2021 ජනවාරි 17 දින සිට ඒවායේ නඩු ඇසීම ආරම්භ කරන ලදී. අභියාචනාධිකරණය හා බන්ධනාගාර 04ක් වීඩියෝ තාක්ෂණය මඟින් සම්බන්ධ කොට සිරකරුවන් රැගෙන ඒමෙන් තොරව නඩු ඇසීම ආරම්භ කරන ලදී.

- ක්‍රමානුකූලව අධිකරණවල විනිශ්චයකාරවරු වැඩි කිරීමට සාපේක්ෂව ඊට අදාළව යටිතල පහසුකම් සැපයීමද තුන් අවුරුදු සැලැස්මක් යටතේ කටයුතු කරමින් පවතී.
- පහත පරිදි ඉදිරි වසර 03 තුළ නව අධිකරණ ශාලා ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

| අධිකරණය | යෝජිත අධිකරණ සංඛ්‍යාව | | | එකතුව |
|---|---|---|---|---|
| | 2021 | 2022 | 2023 | |
| සිවිල් අභියාචනා මහාධිකරණ | 03 | 01 | 02 | **06** |
| වාණිජ මහාධිකරණ | 01 | 01 | 03 | **05** |
| මහාධිකරණ | 09 | 04 | 01 | **14** |
| දිසා මහේස්ත්‍රාත් අධිකරණ වෙන් කිරීම | 23 | 09 | 08 | **40** |
| නව දිසා අධිකරණ | 02 | 01 | - | **03** |
| අතිරේක දිසා අධිකරණ | 08 | 02 | 09 | **19** |
| නව මහේස්ත්‍රාත් අධිකරණ | 02 | 02 | 02 | **06** |
| අතිරේක මහේස්ත්‍රාත් අධිකරණ | 15 | 12 | 13 | **40** |
| සංචාරක අධිකරණ ස්ථිර අධිකරණ බවට පත් කිරීම | 05 | 04 | 01 | **10** |
| පූර්ව නඩු විභාග අධිකරණ | 23 | 20 | 25 | **68** |
| කුඩා හිමිකම් අධිකරණ | 04 | 06 | 13 | **23** |
| ළමා මහේස්ත්‍රාත් අධිකරණ | - | - | 03 | **03** |
| එකතුව | **95** | **62** | **80** | **237** |

- ඒ අනුව අධිකරණ ක්ෂේත්‍රයේ විනිශ්චයකාරවරුන් සංඛ්‍යාව පහත පරිදි වැඩිවනු ඇත.

| අධිකරණය | අධිකරණ සංඛ්‍යාව | | | එකතුව |
|---|---|---|---|---|
| | 2021 | 2022 | 2023 | |
| මහාධිකරණ විනිශ්චයකාරවරුන් | 16 | 07 | 08 | **31** |
| දිසා අධිකරණ විනිශ්චයකාරවරුන් | 10 | 03 | 09 | **22** |
| මහේස්ත්‍රාත් අධිකරණ විනිශ්චයකාරවරුන් | 45 | 27 | 27 | **99** |
| පූර්ව නඩු විභාග අධිකරණ විනිශ්චයකාරවරුන් | 23 | 10 | 10 | **43** |
| කුඩා හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරුන් | 04 | 06 | 13 | **23** |
| එකතුව | **98** | **53** | **67** | **218** |

- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමට පියවර රැසක් ගෙන ඇති අතර, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවද රාත්‍රී දක්වා රාජකාරී වේලාවෙන් අමතරව රාජකාරී සිදු කරමින් ඉතා කඩිනමින් රස පරීක්ෂක වාර්තා නිකුත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළද 2020 වර්ෂය තුළ රස පරීක්ෂක වාර්තා 34,689ක් ලබා දීමට හැකි විය.

## සිවිල් ආරවුල්, අධිකරණය දක්වා නොගොස් විසදා ගැනීම සඳහා සමථ මණ්ඩල ක්‍රියාවලිය බල ගැන්වීම.

- සමථ මණ්ඩල රැස්වන දින ගණන වැඩි කිරීමට ක්‍රියා කොට ඇති අතර සමථ මණ්ඩලය මගින් විසඳනු ලබන ආරාවුල් සංඛ්‍යාව දෙගුණ කිරීමට සැලසුම් කර ඇත. සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ ඉඩම් ආරවුල් පිළිබඳ සමථ මණ්ඩල 07ක් පහත සඳහන් දිස්ත්‍රික්ක පාදක කර ගනිමින් පිහිටුවන ලදි. (යාපනය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, මඩකළපුව, කිළිනොච්චිය, මන්නාරම, වව්නියාව) තවත් දිස්ත්‍රික්ක 07ක ජුලි මාසයට පෙර පිහිටු වීමට කටයුතු කරමින් පවතී. (කොළඹ, ගම්පහ, කුරුණෑගල, පොලොන්නරුව, හම්බන්තොට, මහනුවරල රත්නපුර)

- මූල්‍ය ආරවුල් සම්බන්ධයෙන්ද විශේෂ සමථ මණ්ඩල පිහිටුවීමට කටයුතු කරමින් පවතී. (කොළඹ, ගම්පහ, මහනුවර, මොණරාගල, අනුරාධපුර දිස්ත්‍රික්කවල)

- විදේශගත ශ්‍රමිකයන්ගේ පවුල්වල මෙරට පැන නගින ආරවුල් විසඳීමට සමථ මණ්ඩල නියමු ව්‍යාපෘතියක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට නියමිතයි.

- යුරෝපා සංගමය විසින් සමථ මණ්ඩල ශක්තිමත් කිරීම වෙනුවෙන් යූරෝ මිලියන 7ක වටිනාකමින් යුත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- ණය සහනදායක මණ්ඩලය මගින්, ඉඩම් තබාගෙන ණය ලබාගෙන ඇති අරවුල් විසඳීම සඳහා ප්‍රාදේශිය මණ්ඩල 03ක් ගාල්ල, කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට මූලික කටයුතු සම්පදානය කොට ඇත.

## අධිකරණ ස්වයංක්‍රීයකරණය ව්‍යාපෘතිය

සමස්ථ අධිකරණ පද්ධතියම ඩිජිටල්කරණය සඳහා අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව, තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය හා එක්ව මේ වන විටත් කටයුතු කරමින් පවතී. ගරු අමාත්‍යතුමන් විසින් ඩිජිටල්කරණය හා අධිකරණ ස්වයංක්‍රීය ව්‍යාපෘතිය සඳහා අනුකමිටුවක් පත් කොට ඇත.

- එයට අමතරව ගරු අග විනිසුරුතුමාගේ ප්‍රධානත්වයෙන් උපදේශක කමිටුවක්ද,
- ගරු අධිකරණ අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපාති කළමනාකරණ කමිටුවක් ද පත් කර ඇත.
- ICTA විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙක් පත් කොට ව්‍යාපෘති කාර්යාලයක් ස්ථාපිත කොට ඇත.
- 2021.04.12 දිනට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත

## වීඩියෝ සාකච්ඡා පද්ධති ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

- මෙම ව්‍යාපෘතියේ එක් අදියරක් ලෙස බරපතල අපරාධකරුවන් අධිකරණ වෙත ගෙනයෑමේ අවධානම අවම කිරීම සහ වර්තමානයේ පවතින කොවිඩ් 19 වසංගතයට මුහුණ දීමට විසඳුමක් ලෙස බන්ධනාගාර හා අධිකරණ අතර වීඩියෝ සාකච්ඡා පද්ධති ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. එහි නියම ව්‍යාපෘතිය අධිකරණ ශාලා 23ක් සහ බන්ධනාගාර ස්ථාන 12ක් තුළ ස්ථාපිත කරනු ලැබේ.. එසේම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය ඩිජිටල්කරණය සඳහා රුපියල් මිලියන 30ක මුදලක් ද යෙදවීමට නියමිතය.

- මෙම ප්‍රධාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන තෙක් කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුවද රටතුළ යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය පවත්වාගෙන යෑම උදෙසා මේවන විටත් මූලික වශයෙන් අධිකරණ පවත්වාගෙන යෑම සඳහා ලංකා රාජ්‍ය ජාලය යොදා ගනිමින් වීඩියෝ තාක්ෂණය යොදාගනු ලබයි.

### නඩු වාර්තා ඩිජිටල් පිටපත ගබඩා කිරීමේ ව්‍යාපෘතිය

- නඩු වාර්තා ගබඩා කිරීම සඳහා විශාල වශයෙන් ලේඛනාගාර අවශ්‍ය වන අතර, එය ඉදිකිරීම් පිරිවැය, නඩත්තු පිරිවැය, භූමියේ වටිනාකම ගත් විට ආර්ථික වශයෙන් ඵලදායී නොවේ. ඒ අනුව නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම නඩු වාර්තා ඩිජිටල්කරණය වාණිජ මහාධිකරණය, මහනුවර දිසා අධිකරණය හා මාතර මහේස්ත්‍රාත් අධිකරණය හරහා ක්‍රියාත්මක කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව එහි මූලික කටයුතු මේවන විට ආරම්භ කර ඇත.

### ළමයින්ගේ සාක්ෂි වීඩියෝ තාක්ෂණය මඟින් ලබාදීම

- ළමා ප්‍රඥප්තියට හා ජාතික ළමා ආරක්ෂක ප්‍රතිපත්තියට අනුගත වෙමින් ළමයින් විවෘත අධිකරණයට ගෙන ඒමෙන් තොරව වීඩියෝ තාක්ෂණය මඟින් සාක්ෂි ලබා දීමට පහසුකම් සැලසීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව යාපනය, මහනුවර, ගාල්ල සහ මාතර මහාධිකරණ සඳහා විදේශ ආධාර ලෙස වීඩියෝ තාක්ෂණ උපකරණ සවි කිරීමට කටයුතු කරමින් පවතී. එසේම දේශීය අරමුදල් යටතේ තෝරාගත් තවත් අධිකරණ 25ක මෙම පහසුකම ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

## <u>යල්පැනගිය නීති, ක්‍රියාපටිපාටි හා අණපනත් සංශෝධනය සඳහා සියළුම ආයතන සම්බන්ධීකරණයෙන් වැඩපිළිවෙලක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම</u>.

ගෙවීගිය කාලය තුළ විවිධ නීති 39ක් පමණ සංශෝධනය කිරීමට පියවර ගෙන ඇති අතර, ඉතිහාසයේ පෙර නොවූ විරූ ආකාරයට මහජනතාවට අධිකරණය තුළින් අනාගතයේදී සහන ලබා ගැනීමට අවශ්‍යවන්නා වූ පසුබිම කෙරෙහි අවධානය යොමු කර 1947න් පසු මෙරට නීති පද්ධතිය නිසි පරිදි යාවත්කාලීන කිරීමටද කටයුතු යොදා තිබේ.

ඒ සඳහා නීති ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම පිණිස පහත සඳහන් පරිදි උපකමිටු පත්කර ඇත.

1) සිවිල් නීති ප්‍රතිසංස්කරණ උපකමිටුව

2) අපරාධ නීති ප්‍රතිසංස්කරණ උපකමිටුව

3) වාණිජ නීති ප්‍රතිසංස්කරණ උපකමිටුව

වාණිජ, සිවිල් හා අපරාධ නීති ප්‍රතිසංස්කරණ උප කමිටුව යටතේ එක් එක් නීති සංශෝධනය සඳහා උපදේශන කමිටු පත්කර ඇත.

ඒ අනුව, දැනට නීති සංශෝධන 03ක් සම්මත කර ඇති අතර, දැනට සංශෝධනය වෙමින් පවතින පනත් සංඛ්‍යාව 36 කි. (ඇමුණුම 1)

# අධිකරණ ක්ෂේත්‍රයට අවශ්‍ය යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය

- අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව කෙරෙහි රජය විසින් විශේෂ අවධානයක් යොමු කර 2021 අයවැය කතාව මඟින් විනිශ්චයකාරවරුන් හා කාර්ය මණ්ඩල ප්‍රමාණය අවශ්‍ය පරිදි වැඩි කිරීමටත් නඩු කඩිනමින් විසඳීමට අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් කිරීමටත් වසර 03ක කඩිනම් වැඩපිළිවෙල සඳහා රුපියල් මිලියන 20,000ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ඒ අනුව අධිකරණ ක්ෂේත්‍රයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා උප කමිටුවක් ද පත් කොට ඇත. උක්ත ප්‍රතිපාදන යටතේ නව අධිකරණ පරිශ්‍ර 100ක් ඉදි කරන අතර, පළමු අදියර වශයෙන් නව අධිකරණ පරිශ්‍ර 68ක් හඳුනාගෙන ඇත.

එහි සුවිශේෂීම ව්‍යාපෘතිය වන්නේ අළුත්කඩේ වසර සිය ගණනක් පැරණි ගරා වැටෙන අධිකරණ සංකීර්ණය වෙනුවට ඉදිවන අධිකරණ පියසයි. 2021 වසරේ මුල් මාසය තුළ "අධිකරණ පියස" නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා මුල්ගල තැබීම ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකළ අතර, අදියර 04ක් වශයෙන් ක්‍රියාත්මකවන එම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 16,500ක මුදලක් වැය කිරීමට නියමිතයි.

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා උප කමිටුවක් පත්කොට ඇත.

ඒ යටතේ අදියර 04 කින් යුත් අධිකරණ පියස 2021 ජනවාරි 25 වන දින ආරම්භ කරන ලදී.

<u>අධිකරණ පියස ඉදිකිරීම් සැලැස්ම</u>

**I අදියර - මහේස්ත්‍රාත් අධිකරණ කුළුණ**

මහේස්ත්‍රාත් අධිකරණය 18 ඉදිකරණ අතර 2021.04.09 දින පයිලින් කටයුතු ආරම්භ කරන ලදි.

**II අදියර - අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා ඉදිකෙරෙන කුළුණ**

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන ඇතුළත් කුළුණු මූලික සැලසුම් අවසන් කර පයිලින් කටයුතු සඳහා මිල ගණන් කැඳවා තාක්ෂණික ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී.

**III අදියර දිසා / මහාධිකරණ කුළුණ**

පාර්ශවකරුවන්ගේ රැස්වීම් සහ සැලසුම් හා නිර්මාණ අවසන් කර පයිලින් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ පුවත්පත් දැන්වීම 2021.06.28 වන දින සිදු කිරීමට නියමිතය.

**IV අදියර නිල නිවාස කුළුණ**

සැලසුම් සාකච්ඡා කරමින් පවතින අතර සැලස්ම හා නිර්මාණ කටයුතු කඩිනමින් අවසන් කිරීමට නියමිතය.

- හඳුනාගත් නව අධිකරණ පරිශ්‍ර 68න් තවත් දිවයින පුරා නව උසාවි ශාලා 47ක් කඩිනමින් ආරම්භ කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

- කළුතර අධිකරණ සංකීර්ණයේ නිර්මාණ කටයුතු මේවන විට අවසන් අදියරේ පවතී. එසේම 2017 වසරේ සිට කන්ටේනර් බහාලුම් තුළ පවත්වාගෙන යන සියළු අධිකරණවල පරිපාලන කටයුතු සිදු කරන අධිකරණ සේවා කොමිෂන් සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කර අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

- පෙර නිමි උසාවි ශාලා 08ක් ඉදිකිරීම සඳහා මිල ගණන් කැඳවා මේ වන විට ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී. නව අධිකරණ පරිශ්‍ර 16ක් සඳහා උපදේශන සේවා ලබා ගැනීමට තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් පවතී. අධිකරණ අමාත්‍යාංශය විසින් නිර්මාණ කටයුතු හා සැලසුම් කටයුතු සිදු කරන අධිකරණ ගොඩනැගිලි 20ක මිල ගණන් කැඳවා ඇගයීම් කටයුතු අවසන් අදියරේ පවතී.

අයවැය ඇස්තමේන්තු යටතේ ද රජය විසින් අධිකරණ ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, මාතලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත.



කන්තලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ලංසු කැඳවා මේ වනවිට ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී.



වලපනේ අධිකරණ සංකීර්ණයද සැලසුම් හා නිර්මාණ කටයුතු සිදු කරමින් පවතින අතර, කුඩා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති 07ක් සඳහා මිලගණන් කැඳවා ඇති අතර ලංසු ඇගයීම් කටයුතු මේ වනවිට අවසන් අදියරේ පවතී. උසාවි අළුත්වැඩියා සඳහා ව්‍යාපෘති 41ක් සිදු කිරීමට නියමිත අතර, ඉන් ව්‍යාපෘති 27ක් ප්‍රදානය කොට ඇති අතර, තවත් ව්‍යාපෘති 14ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.

මේ වනවිට පහත අධිකරණ ගොඩනැගිලි අවසන් කර විවෘත කිරීමට නියමිතව ඇත.

මාතර අධිකරණ සංකීර්ණය



වලස්මුල්ල අධිකරණ සංකීර්ණය






කිලිනොච්චිය අධිකරණ සංකීර්ණය





ගම්පොල අධිකරණ සංකීර්ණය






මැදවච්චිය අධිකරණ සංකීර්ණය






එසේම පහත අයවැය ඇස්තමේන්තු මගින් සිදු කරමින් පවතින ව්‍යාපෘති ද කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.

රත්නපුර අධිකරණ සංකීර්ණය






වැලිමඩ අධිකරණ සංකීර්ණය













තෙල්දෙණිය අධිකරණ සංකීර්ණය







පූගොඩ අධිකරණ සංකීර්ණය









හෙල්බොඩ අධිකරණ සංකීර්ණය






රම්බඩගල්ල මහේස්ත්‍රාත් අධිකරණ ගොඩනැගිල්ල

අක්කරෙයිපත්තුව ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය

පොතුවිල් ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය

කල්පිටිය ලේඛනාගාරය හා නඩු භාණ්ඩ කාමරය

වාකරේ අධිකරණ සංකීර්ණය

ආනමඩුව, නාවලපිටිය, ඇඹිලිපිටිය, නාරම්මල, නාවුල සහ හලාවත විනිසුරු නිල නිවාස

2020 වසරේ පහත ව්‍යාපෘති අවසන් කරන ලදි.

- **අනුරාධපුර අධිකරණ සංකීර්ණය**



- නොච්චියාගම අධිකරණය



- රුවන්වැල්ල දිසා මහේස්ත්‍රාත් අධිකරණය



- මාන්කුලම් සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය



- මුලතිව් දිසා මහේස්ත්‍රාත් අධිකරණය



- යාපනය අධිකරණ සංකීර්ණයේ නව ගොඩනැගිල්ල



- කල්මුණේ සිවිල් අභියාචනා මහාධිකරණය



## A. No of Bills currently amending - 35

1. Proceeds of Crime Act
2. Muslim Marriage and Divorce (Amendment) Bill
3. Ottawa Convention
4. Amendment to the Trust Receipts Ordinance to be in line with Secured Transactions Bill
5. Amendment to the Prescription Ordinance) to be in line with the Secured Transactions Bill
6. Child Protection and Justice Bill
7. Obscene Publications Bill
8. Penal Code amendment (Repealing Obscene Publication Provisions) (Sections 285, 286 and 286A)
9. Youthful Offenders (Training Schools) (Amendment) Bill
10. New Legislation to replace the Assistance to and Protection of Victims of Crime and Witness Act
11. Amendment to the Criminal Procedure Code (Duty of Magistrate to visit Police Station)
12. Regulations on Code of Conduct of the Justice of the Peace as per the Section 45 of the Judicature Act, No. 02 of 1978 (as amended)
13. Amendment to the Code of Criminal Procedure Act, No. 15 of 1979 (Day to Day Trial)
14. Amendment to the Code of Criminal Procedure Act, No. 15 of 1979 (Dispensing with the requirement of personal attendance of suspect / accused persons in court under certain identified circumstances)
15. Amendments to the Penal Code (Amendment) (Protection of Human Dignity and Social Harmony, fake News and Hate Speech)
16. Amendment to the Code of Criminal Procedure Act. No, 15 of 1979. (Protection of Human Dignity and Social Harmony, Fake News and Hate Speech
17. Increase of Fines
    Penal Code Amendment
18. Amendments to the CCPA & Code of Civil Procedure.
    (Issue of copies of Judgments of cases free of charge.)
19. Amendment to the Civil Procedure Code (Sections 118, 119) Appointment of Sworn Translators)
20. Amendment to the Drug Dependant Persons (Treatment and Rehabilitation) Act, No. 54 of 2007
21. Drafting of a new Constitution
22. (Civil Procedure Code)
    Marriage Registration Ordinance
23. Community Based Corrections
24. Amendment to Judicature Act, No. 2 of 1978 (Appointment of Recorder Judge for Pre-trial Conference)

25. (Civil Procedure Code)
mendment to the Divorce Laws(Matrimonial Actions)

26. Death Sentence on Minors
(Amendment to section 53 of the Penal Code)

27. Covid 19 (Temporary Provisions) Bill
28. Amendments to the Registration of Documents Ordinance
(Caveat)

29. Committee to make recommendations to amend Poisons, Opium and Dangerous Drugs Ordinance
30. Amendment to the Penal Code
(Statutory Rape and Rape on Boys)

31. (Civil Procedure Code Amendment)
Accidents – Injuries – Deaths

32. Amendment to the Civil Procedure Code
(Section 88(2) and Section 59)

33. Amendment to the Notaries Ordinance
34. Amendment to the Dangerous Animals Ordinance
35. Amendments to the Prevention of Cruelty to Animals Ordinance

**A. No of Bills amended - 03**

1. Penal Code (Removing obsolete words)
2. Evidence Amendment (Removing obsolete words)
3. Bail Amendment (Increase of Fines)

**B. No. of Bills Submitted to approval of the Cabinet - 27**

1. Youthful Offenders (Training Schools) (Amendment) Bill
2. Protection from Online Falsehoods and Manipulation Bill
3. Obscene Publications Bill
4. Penal Code Amendment (Repealing Obscene Publication Provisions)
5. New Legislation to replace the Assistance to and Protection of Victims of Crime and Witness Act
6. Amendment to the Criminal Procedure Code (Duty of Magistrate to visit Police Stations)
7. Amendment to the Code of Criminal Procedure Act, No. 15 of 1979 (Day Today Trial)
8. Amendment to the Code of Criminal Procedure Act, No. 15 of 1979 (Dispensing with the requirement of personal attendance of suspect / accused persons in court under certain identified circumstances)
9. Amendments to the Penal Code (Amendment)
(Protection of Human Dignity and Social Harmony, fake News and Hate Speech)

10. Amendment to the Code of Criminal Procedure Act. No, 15 of 1979.
(Protection of Human Dignity and Social Harmony, Fake News and Hate Speech

11. Penal Code (Increase of Fines)
12. Increase of fines
Convention against Torture and Other Cruel, Inhuman and Degrading Treatment or Punishment Act
13. (Civil Procedure Code) Marriage Registration Ordinance (Family Law)
14. Community Based Corrections
15. Amendment to Judicature Act, No. 2 of 1978
(Appointment of Recorder Judge for Pre-trial Conference)

17.Civil Procedure Code - Amendment to the Divorce Laws (Matrimonial Actions)
18.Death Sentence on Minors (Amendment to section 53 of the Penal Code)

19.Covide 19 (Temporary Provisions) Bill

20. Amendment to the Registration Documents Ordinance (Caveat)

21.Committee to make recommendations to amend Poisons, Opium and Dangerous Drugs Ordinance
22. Civil Procedure Code Amendment (Accidents – Injuries – Deaths)

23. Amendment to the Civil Procedure Code (Section 88(2) (Summons)

24. Amendment to the Penal Code (Statutory Rape and Rape of Boys)

25. Amendment to the CCPA & Code of Civil Procedure
(Issue of copies of Judgments of cases free of charge)
26. Amendment to the Dangerous Animal Ordinance
27. Amendments to the Prevention of Cruelty to Animals Ordinance
28. Proceeds of Crime

## C. <u>No. of Bills received the Cabinet decisions - 20</u>

1. Proceeds of Crime
2. Muslim Marriage and Divorce Bill
3. Ottawa Convention
4. Obscene Publications Bill
5. Penal Code Amendment (Repealing Obscene Publication Provisions)
6. Youthful Offenders (Training Schools) (Amendment) Bill
7. New Legislation to replace the Assistance to and Protection of Victims of Crime and Witness Act
8. Amendment to the Code of Criminal Procedure Act, No. 15 of 1979
(Dispensing with the requirement of personal attendance of suspect / accused persons in court under certain identified circumstances)
9. Amendments to the Penal Code (Amendment)
(Protection of Human Dignity and Social Harmony, fake News and Hate Speech)
10. Amendment to the Code of Criminal Procedure Act. No, 15 of 1979.
(Protection of Human Dignity and Social Harmony, Fake News and Hate

Speech

11. Penal Code (Increase of Fines)
12. Increase of fines

Convention against Torture and Other Cruel, Inhuman and Degrading Treatment or Punishment Act

13. Amendment to Judicature Act, No. 2 of 1978 (Appointment of Recorder Judge for Pre-trial Conference)

14. (Civil Procedure Code) Amendment to the Divorce Laws(Matrimonial Actions)

15. Death Sentence on Minors (Amendment to section 53 of the Penal Code)

16. Covid 19 (Temporary Provisions) Bill
17. Amendments to the Registration of Documents Ordinance (Caveat)

18. Committee to make recommendations to amend Poisons, Opium and Dangerous Drugs Ordinance
19. Civil Procedure Code Amendment (Accidents – Injuries – Deaths)
20. Amendment to the Civil Procedure Code (Section 88(2) (Summons)

**D. <u>No of Bills for Attorney General's approval – 14</u>**

1. Ottawa Convention
2. Obscene Publications
3. Penal Code Amendment (Repealing Obscene Publication Provisions)
4. Amendment to the Code of Criminal Procedure Act, No. 15 of 1979 (Day Today Trial)
5. Amendment to the Code of Criminal Procedure Act, No. 15 of 1979 (Dispensing with the requirement of personal attendance of suspect / accused persons in court under certain identified circumstances)
6. Amendments to the Penal Code (Amendment) (Protection of Human Dignity and Social Harmony, fake News and Hate Speech)
7. Amendment to the Code of Criminal Procedure Act. No, 15 of 1979. (Protection of Human Dignity and Social Harmony, Fake News and Hate Speech
8. Penal Code (Increase of Fines)
9. Increase of fines

Convention against Torture and Other Cruel, Inhuman and Degrading Treatment or Punishment Act

10. Amendment to Judicature Act, No. 2 of 1978 (Appointment of Recorder Judge for Pre-trial Conference)

11. (Civil Procedure Code) Amendment to the Divorce Laws(Matrimonial Actions)
12. Death Sentence on Minors (Amendment to section 53 of the Penal Code)

13. Covid 19 (Temporary Provisions) Bill

14. Amendments to the Registration of Documents Ordinance (Caveat)

E. **<u>No of Bills presented to Parliament - 04</u>**

1. Amendment to the Criminal Procedure Code (Duty of Magistrate to Visit Police Station)
2. Evidence Ordinance (Consolidation)
3. Penal Code (Consolidation)
4. Increase of Fines (Bail)

F. **<u>Passed by Parliament - 03</u>**

1. Evidence Ordinance (Consolidation) (Act, No. 6 of 2021)
2. Penal Code (Consolidation) (Act, No. 5 of 2021)
3. Increase of Fines (Bail) (Act, No. 7 of 2021)